## 182

ඔබ අදහන්නෝ මා සම්දේ – ඔබගේ කටහඬ අඳුනන්නෝ
බැටළු පැටව් තම එඬේරගේ // කට හඬ අඳුනා ගන්නෝ

බැටළු පැටව් වමු අපි කිතුනුවනේ – අඳුනා ගනිමු ද අපි අපගේ
බැටළු එඬේරා කවුදෝ
,මම වෙමි යහපත් බැටළු එඬේරා, – වග තුග ඔබේ කී සැටි සම්දේ

එති මා පසු පස බැටළු පැටව් මගෙ – නෑ යන්නේ උන් ඈත් වැලා
මමයි උනට රැකවරණේ
කෑමට බීමට තිසි තැන් රිසිතැන් – වෙතැ උන් මා දක්වා යන්නේ

අසා ඔබේ හඬ කැඳැවීමේ අප – මෙතෙක් දුරට ඔබ පසු ආවේ
ගැටළු ඉබෝ මතුවන්නේ
කන්දි සිටියොත් කට හඬට ඔබේ – ලිහාගන්න ඔබ අත දෙන්නේ

,යතිද ඔබත් අත්හැරැ දමලා, – යතුවෙත් සවිමත් විමැසූ දිනේ
කෙලෙසද පිළිතුරු ලැබුනේ
,ඔබ ළඟැ ඇත්තේ දිවමන් වචනේ – කොහේ යමුද තව කාව සොයා,

එකහිත් නම් කමු උසා පළාවත් – වෙන හිත් නම් යමු අනේ වෙනත්
කීමෙකි ඒ කට වහරේ
පෙරට තැබූ පය නොගන්නැ ආයෙත් – පස්සට හෙම නම් මැරී ගියත්

කවදාවත් ඔබ නෑ පසු බැස්සේ – ජේසු කිතුනි මගෙ හිමි සඳුනේ
කුරුසෙන් ඔබ නෑ බැස්සේ
කීවත් කපටින් ඔබෙ හිත නළවා – උන්ගෙ වචනෙ ඔබ නෑ ඇහුවේ